# ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## විභාග නිවේදනය

1. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ MM-1-1, JM-1-1, MA-3, MA-2-1 ,MA-1-1 යන සේවා ගණයන්ට අයත් නිලධාරීන්ට අදාළ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2022 මැයි මාසයේදී කොළඹ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙම විභාගය ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් පවත්වනු ලැබේ.
2. මේ දක්වා සිය පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී නොසිටි සියළුම නිලධාරීන් හට මෙම විභාගය සඳහා අයදුම් කල හැක.
3. මෙම විභාගය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ බඳවාගැනීමේ පටිපාටියේ විධිවිධාන අනුව පැවැත්වේ.
4. පහත වගුවේ අනු අංක 01සහ 04 මගින් දක්වා ඇති විභාග සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වෙන අතර අනු අංක 02,03,05 මගින් දක්වා ඇති විභාග සිංහල සහ දෙමළ මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.
5. විභාගය පිළිබඳ මූලික තොරතුරු පහත වගු අංක 01 මගින් දක්වා ඇති අතර ,අදාළ විෂය නිර්දේශයන් ඇමුණුම 1-5 ලෙස දක්වා ඇත.

<u>වගුව 01</u>

| අනු අංකය | විභාගයේ නම,කේත අංකය සහ විභාගයේ ස්වභාවය | විභාගය සඳහා අයදුම් කළ හැකි සේවා කාණ්ඩ සහ තනතුරු | විෂය අංකය සහ විෂය |
|---|---|---|---|
| 01 | <u>විභාගයේ නම</u><br><br>ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මධ්‍යම කළමනාකරණ මට්ටමේ දෙවන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br><br><u>කේත අංකය</u><br>( MM 001)<br><br><u>ස්වභාවය</u><br>ලිඛිත පරීක්ෂණයකි | **එම් එම් 1.1**<br><br>ගණකාධිකාරී<br>සහකාර අධ්‍යක්ෂ - මාධ්‍ය සහ තොරතුරු<br>සහකාර අධ්‍යක්ෂ - නීතිය ක්‍රියාත්මක කිරීම | 1. සාමාන්‍ය පරිපාලනය සහ රාජ්‍ය ප්‍රතිපත්ති<br>2. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය<br>3. සාමාන්‍ය කළමනාකරණය |
| 02 | <u>විභාගයේ නම</u><br><br>ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ දෙවන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br><br><u>කේත අංකය</u><br>( JM 001)<br><br><u>ස්වභාවය</u><br>ලිඛිත පරීක්ෂණයකි | **ජේ. එම් 1.1**<br><br>මාධ්‍ය සහ තොරතුරු නිලධාරී<br>වැඩසටහන් නිලධාරී | 1. කාර්යාල ක්‍රමවේද<br>2. ගිණුම්කරණ ක්‍රමවේද<br>3. විෂයානුබද්ධ දැනුම |
| 03 | <u>විභාගයේ නම</u><br><br>ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ආශ්‍රිත නිලධාරී මට්ටමේ තුන්වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | **එම්.ඒ.3**<br>දිස්ත්‍රික් මනෝ සමාජීය නිලධාරී<br>ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරී<br>උපදේශන සහකාර<br>සාක්ෂි පටිගත කිරීමේ සහකාර | 1. කාර්යාල ක්‍රම<br>2. ගිණුම්කරන ක්‍රම<br>3. විෂයානුබද්ධ කරුණු |

| | | | |
|---|---|---|---|
| | **කේත අංකය**<br>( MA 001)<br><br>**ස්වභාවය**<br>ලිඛිත පරීක්ෂණයකි | | |
| 04 | **විභාගයේ නම**<br><br>ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කළමනාකරණ සහකාර තාක්ෂණිය මට්ටමේ තුන්වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br><br>**කේත අංකය**<br>( MA 002)<br><br>**ස්වභාවය**<br>ලිඛිත පරීක්ෂණයකි | එම්.ඒ.2-1<br>වීඩියෝ තාක්ෂණික සහකාර | 1. කාර්යාල පරිපාලනය සහ ආයතනික ක්‍රියාවලීන්<br>2. මුදල් රෙගුලාසි |
| 05 | **විභාගයේ නම**<br><br>ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන මට්ටමේ තුන්වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමත කඩඉම් විභාගය<br>**කේත අංකය**<br>( MA 003)<br><br>**ස්වභාවය**<br>ලිඛිත පරීක්ෂණයකි | එම්.ඒ. 1-1<br>කළමනාකරන සහකාර (තාක්ෂණික නොවන) | 1. කාර්යාල ක්‍රම<br>2. ගිණුම්කරන ක්‍රම<br>3. විෂයානුබද්ධ දැනුම |

6 වගු අංක 01 මගින් දක්වා ඇති සියලු ම සේවා කාණ්ඩයන්ට අයත් සියලු ම නිලධාරීන් ස්වකීය බඳවා ගැනීමේ පටිපාටියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයන් සමත්වීම අත්‍යවශ්‍ය වේ.

7 මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් නිකුත් කරනු ලබන විභාග නීතිරීති වලට සියලු විභාග අපේක්ෂකයන් යටත්විය යුතු අතර, විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධ සියලු වගකීම් ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් දරනු ඇත.

8 විභාගය සඳහා අයදුම්කිරීමට කැමති අයදුම්කරුවන් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස්කරන ලද අයදුම්පත්...2022.04.30............. දිනට පෙර ලැබෙන සේ සභාපති, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ලිපිනය වෙත ලියාපදිංචි තැපැල මගින් හෝ ncpa@childprotection.gov.lk යන විද්‍යුත් තැපැල් ලිපිනය වෙත පමණක් යොමු කළ යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ වගු අංක 01 හි සඳහන් පරිදි අයදුම් කරන විභාගයේ නම සඳහන් කළ යුතුය.

9 විභාගය පැවැත්වීමට ප්‍රමාණවත් කාලයකට පෙර විභාග කාල සටහන ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වෙබ් අඩවිය සහ ශ්‍රී ලංකා පදනම් ආයතනයේ වෙබ් අඩවිය මගින් ප්‍රසිද්ධ කරනු ඇත.

10 මෙම විභාගයෙන් සමත් වීම සඳහා එක් එක් විෂයක් සඳහා අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

6/4/2022

11 අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සභාපති විසින් සිදු කරනු ඇත. කිසියම් අයදුම්කරුවකු වෙත විභාග ප්‍රවේශ පත්‍රය යම් හෙයකින් නොලැබුණේ නම් අයදුම්පත්‍රයේ පිටපතක් සහ අයදුම්පත ලියාපදිංචි තැපැල මගින් යොමු කිරීමේ දී තැපැල් කාර්යාලය විසින් නිකුත් කරනු ලබන ලදු පතේ පිටපතක් සමග ශ්‍රී ලංකා පදනම් ආයතනය ,100,ශ්‍රී ලංකා පදනම මාවත,නිදහස් චතුරශ්‍රය,කොළඹ 7 (දුරකථන අංක 011-2695249) වෙතින් විමසීම් කළ යුතුය.

12 විභාග ප්‍රවේශ පත්‍රයේ විභාග අපේක්ෂකයාගේ නම සහ අත්සන සහතික කිරීම පහත පරිදි සිදු කළ යුතුය.

I. දිස්ත්‍රික් මනෝ සමාජ නිලධාරී සහ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරී තනතුරු අදාළ දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් හෝ එම නිලධාරීන් විසින් බලය පැවරූ වෙනත් නිලධාරියකු හෝ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති, නියෝජ්‍ය සභාපති, අධ්‍යක්ෂ ජනරාල් හෝ අධ්‍යක්ෂ - පරිපාලන හා මානව සම්පත්

II. ඉහත කාණ්ඩයට අදාළ නොවන අනෙකුත් සියලු ම නිලධාරීන් - ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති, නියෝජ්‍ය සභාපති, අධ්‍යක්ෂ ජනරාල් හෝ අධ්‍යක්ෂ - පරිපාලන හා මානව සම්පත්

13 සියලු විභාග අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී වෙන් වෙන් වශයෙන් සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි තම අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍රයක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය

I. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
II. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. රාජකාරී හැඳුනුම්පත

ඉහත ලේඛන මගින් යථා පරිදි සිය අනන්‍යතාවය තහවුරු කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අපේක්ෂකත්වය විභාග ශාලාධිපතිගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

14 විභාග ප්‍රතිඵල ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සභාපති විසින් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති වෙත නිකුත් කිරීමෙන් අනතුරුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරනු ඇත.මෙම විභාග නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් සම්බන්ධව වුව ද ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ

15 මෙම විභාගය පැවැත්වීම සම්බන්ධ වැඩිදුර තොරතුරු 011- 2778911-14 අංක ඔස්සේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ (පරිපාලන සහ මානව සම්පත්) සම්පත් ගුණවර්ධන මහතා හෝ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) ජනක උදය කුමාර මහතා ඇමතීමෙන් ලබාගත හැකිය. විභාග ප්‍රවේශ පත්‍ර නොලැබීම සම්බන්ධ යම් ගැටලුවක් මතුවුවහොත් 011-2695249 අංක ඔස්සේ ශ්‍රී ලංකා පදනම් ආයතනයේ ලේඛකාධිකාරී අංශය ඇමතීමෙන් ඒ පිළිබඳ පැහැදිලි කිරීම් ලබාගත හැකිය.

අනෝමා සිරිවර්ධන

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

06 / 04 / 2022 දින

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

අංක 330

තලවතුගොඩ පාර

මාදිවෙල - කෝට්ටේ